# පිරිවෙන් අධ්‍යාපනය හා එහි අධිකාරිත්වය

*අභයරත්න අදිකාරි*

සඟ පරපුරේ ඓතිහාසික සම්ප්‍රදායානුකූල අධ්‍යාපනය පිරිවෙන් නම් වූ සුවිශේෂ ආයතනයන්හි ක්‍රියාත්මක විණ. පාරිශුද්ධ වූ ශාසන ප්‍රතිපත්තීන් සමග මහසඟරුවන ප්‍රගුණ කළ අධ්‍යයන අධ්‍යාපන ක්‍රමවිධි ඉතිහාසය පුරා ම සාකල්‍යයෙන් ම සංගෘහිතව පවත්නේ ය. පවිත්‍ර චර්යාවේ ගුණාත්මක ස්වරූපය වඩා සම්භාවනීයත්යට පත්වූයේ තෙවළා දහමින් පරිපෝෂිත ඥාන සම්භාරයක් ඔබවහන්සේ විසින් අත්පත් කරගෙන සිටි බැවිනි. පෙළ-අටුවා-ටීකා හා ප්‍රකරණ වශයෙන් තෙවළා දහම පිළිබඳ ව්‍යාප්තිය අතිශයින් සත්තාවාදී වීතරාගී සන්මාර්ගයේ අරුණලු මොනවට ප්‍රකට කළ හෘදයඞ්ගම ක්‍රම විධි අන්තර්ගත වූවකි. හෙළඹිමේ සුසංවිධිත මූල ධර්මය වූයේ, භාණක ක්‍රමය හෙවත් වාචනා මාර්ගයයි.  අක්ෂරමාත්‍රයකිනුදු ගිලීහී යාමට ඉඩ නොදී ආචරියවාද නියමයන් ද අනුව දහම රක්ෂිත පෝෂිත කරන ලද්දේ 'පිරිවෙන' නමින්වූ ආරාම කුටිවල  වැඩවසමිනි. අනතුරුව සජ්ඣායනා කිරීමේ අවශ්‍යතාව වඩාත් දැනෙන්නට වීමේ ප්‍රතිඵලයක් වශයෙන් පවුරු පදනමින් සුස්ථිරවූ ද, පරික්ෂෙපවූ ද සංඝාවාසයක් තුළ තත් ශාසනික කර්තව්‍යය සිදු කළහ. කාලයාගේ ඇවෑමෙන් එකී සංඝාවාස සංකීර්ණ බවට පත්ව, මහසඟන භාණක, පඨන-පාඨන, උද්ග්‍රහණ-ධාරණ, සජ්ඣායන-වාචන, ආචික්ඛණ-දෙශන, විවරණ-විභජන, පරිපුච්ඡන න්‍යායයන් ක්‍රියාත්මක කිරීමේ කෙන්‍ද්‍රස්ථාන දක්වා ව්‍යාප්ත විණ. ඓතිහාසික මූලාශ්‍රයන්ට අනුව මහාවංශයත්, අටුවා හා ටීකා-යථොක්ත පිරිවෙන්-පරිවේණ ආයතනය වඩාත් පුළුල් නිර්වචනයෙන් පරිභාවිත විණ. ක්‍රි.ව. පස්වන සියවස වන විට රජුගේ අග්‍රාමාත්‍යවරයා විසින් ඉදිකළ අනුරාපුර "**දීඝසන්ධ**" **පිරිවෙන** සුස්ථිර පදනමක පැවතිණ. අනුබුදු මිහිඳු මාහිමියන් වැඩ සිටි දෙවන පෑතිස්ස රජු (ක්‍රි.ව. පූර්ව 307-267) විසින් ඉදිකළ සක්මන සහිත කුටිය, **දීඝචංකමණ පිරිවෙන** වැදගත් වනුයේ බුදු දහම මෙරටට ආ මුල් අවධියේ ම ඉදිකළ එක්තරා සංඝාවාසයක් බැවිනි. මාහිමි ජලස්නානය කළ තන්හි රජු ඉදිකළ කුටිය "**සුන්හාත**" නම් විය. මාහිමි ඵල සමවතට සමවැදුණු තන්හි රජු කළ කුටිය "**ඵලග්ග පිරිවෙන**"යි. දෙව් මිනිසුන් පැමිණ මාහිමිට උපස්ථාන කළ තන්හි ඉදිකළ කුටිය "**කාලපාසාද**" **පිරිවෙනයි**. "අනුජානාමි භික්ඛවෙ පරිවේණග්ගෙන දපෙතුං"යි චූලවග්ග පාළියෙහි එන පාඨය භික්ෂූන් විසූ ආවාසය, පිරිවෙණ නමින් හඳුන්වා තිබූ බැව් සනාථ වේ. පාළි ශබ්ද කොෂයට අනුව භික්ෂුව වැඩසිටි ස්ථානය **පිරිවෙණ** නමින් හැඳින් වූ බැව් සනාථ වේ.[5] ශාරිපුත්‍ර මාහිමිගේ සාරත්ථදීපනී



ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

ටීකාවේ 'පරිවේණානති ........ පාකාරාදීහි පරිච්ඡන්නට්ඨානං'යි කර ඇති විග්‍රහය ප්‍රස්තුතයට වැදගති. 'පරිවේණං තං තං භික්ඛූනං වසනට්ඨානං'යි **විමතිවිනොදනී** ටීකාවේ ද 'දූරපරිවේණතාල නාරිකෙර ආදීනි රෝපෙත්වා'යි **සංයුත්ත නිකාය** අටුවාවේ ද, 'පාසාද පරිවෙණ සංඝාරාම' යි විසුද්ධිමග්ග යෙහි ද හඳුන්වා තිබීමෙන් පිරිවෙන කවරනම් ස්ථානයක් දැයි ප්‍රකට වේ.

තවද ධම්මපදට්ඨ කථාවේ 'වේණයතො පක්ඛිතභූතං පරිවෙණං..........ද්වාර කොට්ඨකයුත්තං ආවාසං' යිද දක්වා තිබීම ප්‍රස්තුතයට වැදගති. පරිවාර පාළියෙහි 'විහාරෙන විහාරං, පරිවෙණෙන පරිවෙණං' යන පාඨයෙන් විහාරයත් පිරිවෙනත් වෙන් වෙන් වශයෙන් දක්වා තිබීම පැහැදිලි නිගමනයකට ඒමට පහසු කරයි.

එවක මහා විහාර සීමාව තුළ පිරිවෙන් 364ක් ද මිහින්තලයෙහි අටසැට ලෙනක් හා රුහුණු දනව්වෙහි තුන්සිය හැටතුනක්ද පැවති බැව් වාර්තා වේ. තවද පසුකාලීන හෙළ බසින් ලියූ මූලික ධර්ම ග්‍රන්ථයන්හි ද කුටිය, ආවාසගෙය ආදි අරුත් ගම්‍යවන 'පිරිවෙන' යන්න භාවිත වූ අයුරු සද්ධර්මාලංකාරයෙහි 'තිස්මහ වෙහෙර සිල්වස පිරිවෙන' යි ද, උමංදවෙහි 'ගඳකිළි පිරිවෙනෙහි වැඩහුන් සේක් දිවකතින් අසා වදරා' යි ද කරඇති සඳහන් කිරීම්වලින් අනාවරණය වේ. මේ ක්‍රමය ව්‍යාප්ත වීමත් සමඟ දක්ඛිණගිරි, පාචීන පබ්බත, ගොකණ්ණගිරික, කල්ලකලෙණ, ආළාහණ, කප්පූර, ග්‍රන්ථාකර, දඨග්ග බොධි, භාණ්ඩික, මහා පරිවේණ ආදි මූලස්ථාන ද, මහාවිහාර, චෙතියගිරිය, ථූපාරාමය, ඉසුරුමුනිය, මෙඝගිරි මූලවිහාර ද අටුවා සහිත පෙළ දහම ආරක්ෂා කරමින් අධ්‍යයන අධ්‍යාපන කටයුතු සිදු කළාවූත් පඨන-පාඨන, සජ්ඣායන ක්‍රම විධි ක්‍රියාත්මක කළා වූත් සුවිශේෂ කෙන්ද්‍රස්ථාන පිරිවෙන් ආයතනය අර්ථවත් කළා වූ ප්‍රධාන ස්ථානයෝයි. ප්‍රස්තුත කරුණ තවදුරටත් සනාථ වන පහත සඳහන් **බොධිවංස පාඨය** අතිශයින් වැදගත් වන්නේය.

'මහණුන්ගේ වාසයට යොග්‍ය වූ විහාරය මහාවිහාරය නම් යයි කියා එහි කාළප්‍රාසාදයයැ, ලොවාමහා ප්‍රාසාදයයැ, ලාබත්ගෙයයැ, ශාලාවයයැ, සුණ්හාත පිරිවෙණයැ, දීක්සඳ සෙනෙවියා පිරිවේණයැ, රාත්‍රිස්ථාන දිවාස්ථානයැ, සක්මනයැ, පොකුණයැ යන මේ සියල්ලෙන් සරසා විහාර ප්‍රතිෂ්ඨාපනය කළසේක.'

උත්තර භාරතයෙන් ගෙන ආ ත්‍රිපිටකයත්, ආචරියවාද සහිත දේශීය අටුවාත්, අටුවා සඳහා පසුව ලියූ ටීකාත් අඛණ්ඩව ආරක්ෂා වූයේ අනුරාධපුර මහාවිහාරය ප්‍රධාන කොට පැවැති පූර්වෝක්ත ඓතිහාසික කෙන්ද්‍රස්ථාන නිසාය. ඒ බැව් සනාථ වන මූලික කරුණු කිහිපයක් පහත සඳහන් වේ.

1 ද්වාර පණ්ඩිත යසපාල මහතෙරණුවන් ශාසනික හා ශාස්ත්‍රීය කර්තව්‍යයන්හි නියුක්ත වූයේ මහාවිහාර දූරසංකර ග්‍රන්ථාකර පිරිවෙන මූල්කරගෙනය.

2. භාරතයේ මගධ දෙශයෙන් වැඩමවූ විශුද්ධ බුද්ධීන් ප්‍රබුද්ධ ප්‍රසිද්ධ බුද්ධඝොෂාචාරීන් හෙළටුවා හා ආචරියවාද මැනවින් අධ්‍යයනය කොට එකී සියල්ල පාළිභාෂාවට නැගුයේ ද දූරසංකරග්‍රන්ථාකර පිරිවෙන්හිදී ය.



ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

3. භාරතීය ඓතිහාසික වාර්තාවනට අනුව මහාවිහාර ත්‍රිපිටකධාරී යතිවරුන් හා ආන්ද්‍ර දේශයේ නාගාර්ජුනී කොණ්ඩ නම් මූලස්ථානයට පැවති කිට්ටු සම්බන්ධතාව නිසා පමණක් නොව කාශ්මීර, ගන්ධාර, වනවාස, යවන, ද්‍රවිඩ හා චීන දෙශයන් හා පැවති සම්බන්ධතා නිසා බුදුසමය හා එහි සංස්කෘතික අංශවල ව්‍යාප්තිය ශීඝ්‍රව සිදුවීම[9]

4. දික් සඟි අටුවාව 'සුමඞ්ගලවිලාසිනී' නම් වූයේ, බුදුගොස් හිමියන් එය ලීවේ සුමඞ්ගල පරිවේණාධිපති හිමියන්ගේ ආරාධනයෙන් බැවිනි.

5. අටුවා හා ටීකා කරණයත් මුලින් ම පැවති භාණක ක්‍රමයත් ඉපැරණි සම්භාව්‍ය අධ්‍යාපන ක්‍රමයේ මූලධර්ම තුනකි.

6. මහාවිහාර සීමාව තුළ වූ ථූපාරාමයත්, මොණර පිරිවෙන හා මිරිසවැටියත්, මහානාම තෙරපාණන් පටිසම්භිදමග්ග අටුවාව ලියූ උත්තරමන්ත්‍රී පිරිවෙනත් එවක අතිශය කීර්තිමත් ආයතන විය.

පූර්වෝක්ත ආයතන ක්‍රි.පූ. තුන්වන සියවසේ සිට ක්‍රි.ව. පස්වන සියවස දක්වා වර්ධනය වූ ආරාමික අධ්‍යාපනයේ මූලික මූලධර්ම ක්‍රියාත්මක වූ කාලපරිච්ඡෙදයයි. සීගිරි කුරුටු ගීවලින් අනාවරණය වන හයවන සියවස සිට නවවන සියවස දක්වා වූ කාලපරිච්ඡෙදය තුළ පැවති පිරිවෙන් ආයතන පහත දැක්වෙන විස්තරයෙන් දැක්වේ.

1. අකුලවැටි පිරිවෙන — සීගිරි පද්‍ය 506 හිද
2. මාතා නම් පිරිවෙන — සීගිරි පද්‍ය 189 හිද
3. සලගල පිරිවෙන — සීගිරි පද්‍ය 454 හිද
4. කබල්නාපා පිරිවෙන — සීගිරි පද්‍ය 802 හිද
5. වෙහෙල්නරු පිරිවෙන — සීගිරි පද්‍ය 529 හිද
6. වනගල පිරිවෙන — සීගිරි පද්‍ය 552 හිද
7. මානාපව් පිරිවෙන — සීගිරි පද්‍ය 254 හිද
8. තලපා පිරිවෙන — සීගිරි පද්‍ය 275 හිද සඳහන් වේ.

දිවයින පුරා ව්‍යාප්තව පැවති භික්ෂු අධ්‍යාපන ආයතන පිළිබඳ වැදගත් ඓතිහාසික වාර්තා ඒවායින් ප්‍රකට වේ. අනුරාධපුර මහාවිහාරයේත් දකුණේ මාගම තිස්සමහාරාමයේ හා සිතුල්පව්ව පිහිටි පූර්වෝක්ත භික්ෂු ආයතනයන්හි මහසඟන මෙන් ම ගිහි බෞද්ධයින් ද තෙවළා දහමත්, අනුගත සියලු විදෂයයනුත් පිළිබඳ ගැඹුරු පෘථුල ඥානයක් අත්පත් කරගත් බැව් නිශ්චිත කරුණකි. ඓතිහාසික වාර්තාවනට අනුව මුල්ම යුගයේ අධ්‍යාපනයේ විශිෂ්ටාර්ථ වූයේ, අධ්‍යාත්ම පාරිශුද්ධිය



ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

හා විශිෂ්ට තම චර්යා ධර්මයි. ලෞකික ලාභසත්කාර සාකල්‍යයෙන් ම ප්‍රතික්ෂේප විණි. මැදුම් සඟි අටුවාවට-පපඤ්චසූදනී-අනුව භික්ෂූන් ලාභසත්කාර අපේක්ෂාවෙන් ධර්මඥානය ලබනුවාට වඩා කාලය නාස්ති නොකර නිදගැනීම වඩා හොඳ බැව් දක්වා තිබේ. ආරාමික පිරිවෙන් පරිසරය සංවිධිත වූයේ සෑම අචාර්ය හිමි නමක් විසින් ස්වකීය ශිෂ්‍යවරයන්ට අන්තෙවාසික සද්ධිවිහාරික පිළිවෙත් පිළිපදිමින් අනිවාර්ය පුහුණුවක් ද ලබමින් ධර්ම විනය ඥානය අත්පත් කරගනු සඳහා ය. නියමිත පිළිවෙත් පුහුණුවෙන් බැහැරි කිසි නමකට එකී ආයතනයන්හි නේවාසික වීමට අවසරයක් නොවීය. කාලදීසවාපී පිරිවෙන්පති ආචරිය හෝ ශිෂ්‍ය නමක් පුහුණුව සඳහා ඇතුළත් කරගත්තේ ගම් දනව් ආදියෙහි අනවශ්‍ය චාරිකා අත්හරින කොන්දේසියට යටත්වය. මෙම ආයතන පවත්වා ගෙනයාම සඳහා පාලක රජුන් නිරතුරුව ම අනුග්‍රහ දක්වා තිබේ. II වන කසුප් (ක්‍රි.ව. 641-650) II වන මිහිඳු (ක්‍රි.ව. 792-798) ත්‍රිපිටකයත්, විශේෂයෙන් අභිධර්මයත් ඉගැන්වීම සඳහා ඉමහත් ප්‍රයත්නයක් දැරූහ. ශාසනාන්තර්ධානයේදී අභිධර්මය පළමුවත්, ධර්ම විනය අනතුරුවත් එසේ වන බැව් අටුවාව පැහැදිලි කරයි. 'පඨමං අභිධම්ම පිටකං නස්සති' යනු අටුවා පාඨයි. II මුගලන් රජු (ක්‍රි.ව. 537-566) බාලපරපුරට දහම උගන්වනු සඳහා නිතිපතා රසකැවිලිවලින් සංග්‍රහ කළබැව් වාර්තා වේ. වසර පන්සාළිස ක් රාජ්‍යය විචාළ වසභ රජු (ක්‍රි.ව. 61-105) සමය අවසන් වත්ම මහතෙරවරුන් විසින් රැක ගෙන ආ ත්‍රිපිටකය, අටුවා හා ආචරියවාද භාණකාචාර්යවරයන් විසින් ම හෙළ බසින් ලියා තබන ලදි.

**මහායාන දහම හා සකුබස:**

දුටුගැමුණු (ක්‍රි.පූ. 161-13), වළගම්බා (ක්‍රි.පූ. 89-77) අතර වසර සියයක් වූ කාලය තුළ මහාවිහාර සම්ප්‍රදයයේ වෙනසක් හටගත්තේ මහායාන දහමට හා සකුබසට මහාවිහාර භික්ෂූන් නැඹුරුවීම නිසා ය. මෙම මතවාද පිළිගත් මුල් තෙර මහාතිස්ස නම් වූ. රජු කරවා පිදූ අභයගිරිය පිළිගත් තෙර තදනුබද්ධ ඉගැන්වීම ද ප්‍රවර්ධනයට පත් කළහ. දකුණු ඉන්දීය පල්ලවාරාමයේ ධම්මරුචි ආචාර්යවරයා හා පිරිස ද මෙහි පැමිණ ස්වවාද හා ඉගැන්වීම් ව්‍යාප්ත කළහ. අභයගිරිය වැඩිකල් නොගොස් භාරතීය දර්ශනවාද, ශිල්ප ශාස්ත්‍ර, විවිධ විද්‍යා, න්‍යාය විධි ඉගැන්වූ කේන්ද්‍රස්ථානයක් බවට පත්විය. කල්යාමේදී මහාවිහාරය පාළි භාෂාව මාධ්‍යය කරගත් ත්‍රිපිටක-අටුවා-ටීකා කරණය හා ප්‍රකරණ කෘති නිෂ්පාදනය කළ භික්ෂු මධ්‍යස්ථානය බවට පත්වූ අතර, එය සාකල්‍යයෙන් ම ථෙරවාදී නිකායික ද විය. සකු බස මාධ්‍යය කරගත් අභයගිරිය වෛතුල්‍යවාදය පිළිගත් අතර භාරතීය මහායාන ආචාර්යවරුන්ගේ ග්‍රන්ථ සමුදායය පරිශීලනය කිරීමටත්, සකුබස ප්‍රධාන විවිධ විෂයයන් ඉගෙනීමටත් කැමැත්ත පළ කළහ. කල්යාමේදී මහාවිහාර, අභයගිරි දෙපාර්ශ්වයේ ම භික්ෂූහු මාධ්‍ය දෙකින් ම ලිඛිත ධර්ම හා දර්ශන ග්‍රන්ථත්, භාෂා ශාස්ත්‍ර හා ඡන්දස් අලංකාර, ව්‍යාකරණ ග්‍රන්ථත් බෙහෙවින් පරිශීලනයට පෙළඹුණහ. සර්වාස්තිවාදී නිකායයේ ප්‍රධාන මහායාන භික්ෂුව වන අශ්වඝොෂ පාදයන් ත්‍රිවේදප්‍රාප්ත බ්‍රාහ්මණ වංශිකයකු වූ බැවින් තමන් ලියූ සියලුම ධර්ම කෘතීන්හිදී තම දේශයේ පැවති කාව්‍ය සම්ප්‍රදායයන් උපයෝගී කරගත් හෙයින් ඒවා බෙහෙවින් ජනප්‍රිය විය. බුද්ධ චරිතය, සෞන්දරනන්දය,



ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

ශාරිපුත්‍ර ප්‍රකරණය යන විශ්‍වසම්භාව්‍ය කාව්‍ය කෘති පමණක් නොව ලලිත විස්තර, වජ්‍රසූචි, සූත්‍රාලංකාර හා ශ්‍රද්ධොත්පාදය ආදි ග්‍රන්ථ ද අභයගිරියෙහිදී පරිශීලනය කිරීමටත් පහසුවෙන් ඉගෙනීමටත් පහසුකම් සැලසී තිබිණ. **ආර්ය ශූරපාදයන්ගේ** ජාතක මාලාව, යෝගාචාර නිකායේ නායක **අසංගපාදයන්ගේ** මහායාන සම්පරිග්‍රහ ශාස්ත්‍රය, සූත්‍රාලංකාර ටීකාව, ප්‍රකරණාර්‍යවාචා ශාස්ත්‍රය, විද්‍යාමාත්‍ර අසිද්ධි ශාස්ත්‍රය, දශභූමිකා ශාස්ත්‍රය වැනි කෘති ද අභයගිරියෙහි ප්‍රචලිත වූ නිසා ඉගෙනීම සඳහා වූ විෂය පථය බෙහෙවින් පුළුල්ව පැවතිණි. **වසුබන්ධුපාදයන්ගේ** කථා සංග්‍රහය, **නාගාර්ජුනපාද** යන්ගේ ප්‍රඥපාරමිතාව, මාධ්‍යමික කාරිකාව, ලංකාවතාර සූත්‍රය ඇතුළු සූවිස්සක් ශාස්ත්‍රීය කෘති ද, චන්ද්‍රකීර්තිපාදයන්ගේ මාධ්‍යමිකා වන **ප්‍රසන්නපාද** සුහෘල්ලේඛා කෘති ද, අභයගිරියෙහි පරිශීලනය විය. රාජවංශික **ශාන්තිදේවපාද** යන්ගේ කාරිකා 27කින් පරිමිත ශික්‍ෂා සමුච්චයත්, සූත්‍ර සමුච්ච හා බොධිචර්යාවතාරයත් අතිශය පිළිගත් විෂය කෘති බවට පත්වූ අතර මහාවිහාරය, අභයගිරිය හා ජේතවනය යන ත්‍රෛනිකායික කේන්ද්‍රස්ථානයන්හි වෙසෙසින් පරිභාවිත විය. යළිදු **වල්ලභදෙව** යන්ගේ සුභාෂිතරත්නාවලී, **මෞද්ගල්‍යායන** ගේ ප්‍රඥප්ති ශාස්ත්‍ර, **ශාරිපුත්‍රාචාර්යයන්** ගේ ධර්මස්කන්ධ, **කාත්‍යායනී** පුත්‍රගේ ඥානප්‍රස්ථය, **ක්ෂෙමේන්ද්‍රයන්** ගේ බුද්ධාවතාරයද **සංඝභද්‍ර**. **ආර්යධර්මගුප්ත**. **වසුමිත්‍ර** ආචාර්යවරුන්ගේ ධර්ම, දර්ශනික, න්‍යාය, තර්ක ආදි විෂයබද්ධ අග්‍ර ඉගැන්වීම් පූර්වෝක්ත කේන්ද්‍රස්ථානයන්හි ඉගැන්වූ විෂයය සමුදායයනට අන්තර්ගත විණ. මෙම විපර්යාසයන්හි අග්‍රඵලය වූයේ, මෙතෙක් ථෙරවාදී බෞද්ධ අධ්‍යාපනයේ මාධ්‍යය වූ පාළි භාෂාව මහායාන අධ්‍යාපනයේ සංස්කෘත භාෂාව හා තත්තත් විෂය සමුදායයන්ගේ අනිවාර්ය සංකලනයෙන් මහාවිහාරයේ එතෙක් පැවති සම්ප්‍රදායානුකූල අධ්‍යාපන ව්‍යූහයේ අනිවාර්ය විපර්යාසයක් ඇති විය.

## වියත්පත් අටගණය

පූර්වෝක්ත **මහානතක**. **බගිරිනක**. **දෙනානක** යන තුන්නිකාය අයත්ව පැවති පිරිවෙන්වලට අතිරේකව හත්වන සියවසේ සිට ආරම්භව සොළොස්වන සියවස දක්වා පැවති කීර්තිමත් උසස් ආයතන අටක් ගැන ඓතිහාසික තොරතුරු ප්‍රධාන මූලාශ්‍රයන්හි අන්තර්ගතව තිබේ.

1. ගලතුරු මූල 2. උතුරුමූල 3. විල්ගම්මූල 4. මහනෙත් පාමූල

5. දකුණු මූල 6. කපාරාමූල 7. සෙනෙවිරද්මූල 8. වාදුම්මූල

යන මේ ආයතන අට අයතන්, අට අයාතුන් අෂ්ටායතන නම්වලින්ද හඳුන්වා තිබේ. බහුශ්‍රැත පරිවේණාධිපතීන් වහන්සේලා අතරින් වඩාත් පිළිගත් මහතෙර නම ආයතනාධිපති ධූරයට ද ආයතන අටේ වනවාසී හා ග්‍රාමවාසී මහතෙරවරුන් අටදෙනාගෙන් වඩාත් සුදුසු නම මාහිමි පදවියට ද පත්වූහ. දන උගත් බහුශ්‍රැත මහතෙරවරුන් නම් වශයෙන් ස්වකීය සේවාවන් ද සහිතව විස්තර කරන නිකාය සංග්‍රහය:

ශාරිපුත්‍ර මහා ස්වාමිපාදයන් පටන් සංඝරක්ෂිතය, සුමංගලය, වාගීශ්වරය, ධර්මකීර්තිය, නාගසේනය, ආනන්දය, වේදේහය, බුද්ධප්‍රියය, අනවමදර්ශීය, යනාදී



ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

මහා ස්ථවිරයෝ නොයෙක් ටීකාර්ථ කථා සහ තත් ප්‍රවේශපාය වූ අනේක ප්‍රකාර ධර්ම ප්‍රබන්ධ, සන්න, ගැටපද, පිටපත් ආදිය උපදවා බුදුන්ගේ පර්‍යාප්ති ශාසනය බැබලවූහ' පළමුවන සංඝරාජ හෙවත් මාහිමියන් වන 'සාගරමති ශ්‍රී ශාරිපුත්‍ර ශාසනානුශාසකවරයන්ගේ ශිෂ්‍ය ඔබ වහන්සේලාගේ ශාසනික ශාස්ත්‍රීය සේවය මින් දක්වේ.

පූර්වෝක්ත මූලායතන අතුරෙන් ගලතුරුමූල හා විල්ගම්මූල මහානකට (මහාවිහාරයට) අයත්ය. කපාරාමූල, උතුරුමූල වාදුම්මූල, හා මහනෙත්පාමූල බගිරිනකට ද .(අභයගිරිය දකුණු මූල හා සෙනෙවිරද්මූල දෙනානකට ද (ජේතවනය) අයත් ය.

## පිරිවෙන් විෂය ව්‍යාප්තිය

ඉතිහාසයේ මුල්ම සියවස් අටක කාලයක් හෙළබස් මාධ්‍යය ඔස්සේ දහම පිළිබඳ ඥාන සම්භාරය අත්පත් කොට ගෙන ඇත්තේ පහත දැක්වෙන විෂය සමුදයයෙන් ය.

1. හෙළ බසින් බ්‍රාහ්මී අක්ෂර සමුදය ප්‍රයෝජනයට ගෙන කරවා ඇති සෙල්ලිපි

2. මධ්‍යම ප්‍රමාණයේ ඇතුන් හත්දෙනකුගේ ප්‍රමාණයට ගොඩකළ හැකි තරමේ හෙළටුවා සම්භාරය

3. බෙළ වංස කථා හා ඒවායේ පරිවාර කෘති

4. හෙළ සූත්‍ර ධර්ම සමුදය

5. හෙළ වෙද හෙදකම් සඳහා වූ කෘතීන්හි අඩංගු විෂය පථය

## දෙවන පියවර

පෙළ බස හා තුන්පිටකය අටුවා - අනතුරුව ජ්‍යොතිශ්ශාස්ත්‍රය, වෛද්‍ය ශාස්ත්‍රය, භූත විද්‍යාව, සංස්කෘත භාෂාව හා ඒ මධ්‍යකොට ඇති තවත් විෂයයන්

කල් යත් ම නිකාය තුනම ඇඳහූ බෞද්ධජනතාව වැඩියෙන් ප්‍රියකළ 1 ධර්ම දේශනා ක්‍රම 2 පරිත්‍රාණ ධර්ම දේශනා 3 ජාතක දේශනා 4 යුගාසන දේශනා 5 සරභඤ්ඤ සජ්ඣායනා යන දේශනා ප්‍රචලිත යුගය ඇතිවිය. මේ අතර විද්වතුන් වඩාත් අවධානය යොමුකළ ශාස්ත්‍රීය අධ්‍යාපනයක් අයත් විෂයයන් තුන්වන පිටවර සේ සැලකිය හැකිය. එනම්:

1. ව්‍යාකරණ ශාස්ත්‍රය 2. ඡන්දස් හා අලංකාර ශාස්ත්‍ර

3. කාව්‍ය ශාස්ත්‍රය 4 තර්ක හා න්‍යාය ශාස්ත්‍ර

5 ප්‍රතිමා කරණය . 6 සිතුවම් විෂය යන මේවා ය.



ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

### තෙවන පියවර

අටුවා සඳහා රචිත ටීකා විෂය ද, පෙළ, අටුවා හා ටීකා ද ඇසුරින් ලියන් ලද විවිධ ප්‍රකරණ ග්‍රන්ථද විෂයමාලාවට එකතුවීමෙන් අධ්‍යාපනයේ ව්‍යාප්තිය ඉක්මන් විය. පිරිවෙන් ආයතනයන්ගේ ව්‍යාප්තියත් සමග මහ සඟ රුවන ගණනින් වැඩිවිය. චීන පයිටක ෆාහියන්ගේ වාර්තාවන්ට අනුව මෙම දිවයින පුරා පිහිටි ආරාමයන්හි භික්ෂූන් 50000 ක් 60000 ක් අතර ප්‍රමාණයක් වැඩසිටි බැව් අනාවරණ වේ. මේ අතර අගනුවර භික්ෂූන් 5000 ක් ද මිහින්තලේ 2000 ක් ද තිස්සමහාරාමයේ හා සිතුල්පව්වේ 12000 කට වැඩි ප්‍රමාණයක් වැඩ සිටි බැව් වාර්තා කොට ඇත. අනුරාධපුර රාජධානිය ප්‍රමුඛ කොට මුලුමහත් රටේ ම පැවති ශ්‍රී සෞභාග්‍යය සොළී ආක්‍රමණ නිසා ක්‍රි.ව. 1010 වන විට තුරන් වී අරාජක තත්වයට පත්විය. ශාස්ත්‍රායතන හා සඟපරපුර නෂ්ටප්‍රාය විය.

### කීර්ති කුමාරයා

සොළීන් පළවා හැර යළි තුන් සිංහලය එක්සත් කොට රටට සෞභාග්‍යය උද කෙළේ පළමුවන විජයබාහු නරේද්‍රයන් විසිනි.

1. රජු (ක්‍රි.ව. 1051-1106) අරමණ දේශයෙන් සම විසි නමක් භික්ෂූන් වැඩමවා උපසම්පදව ඇති කොට සඟ සසුන් යළි පිහිටුවිය.

2. භික්ෂු ආයතන, පිරිවෙන්, ආරාම පුනරුත්ථාපනය කොට සසුන් කෙත සරු කිරීමට මහ සඟනට අනුග්‍රහ දක්වීය.

3. නෂ්ටප්‍රායවූ අගනා ග්‍රන්ථ යළි ලියවා සුලබ කිරීමට ප්‍රයත්න දරූ රජු විද්වතුන් ශාස්ත්‍රීය කර්තව්‍යයන්හි දිරිගැන් වී.

4. ව්‍යවස්ථාපිත සෙල්ලිපි මගින් නඩත්තු කටයුතු සඳහා ගම්බිම් පුද කෙළේය.

5. දේශීය, විදේශීය කළි කළහ, ආක්‍රමණ මුලිනුපුටා සාමයෙන් රට කරවීමට පියවර ගත්තේය.

රජුගෙන් පසු රටට අහිතකර ආක්‍රමණ ඇතිවුවද මහ පැරැකුම්බා (ක්‍රි.ව. 1153-11) රට තම අණසකට යටත් කොට තුන්නිකාය එක්සත් කොට, ක්‍රි.ව. 1165 දී ශාසන ශෝධනයක් ද ඇති කොට රටට සෞභාග්‍යය උදකෙළේය. සසුනට, ශබ්ද ශාස්ත්‍රයට විශිෂ්ටතම සේවය උදකළ රජු,

තමන්ගේ අභිනව විරුද නාමයෙන් තුන්සිය හැටක් පිරිවෙන් කරවා, තුන්දහස් සත්සියයක් මාලුවරුන් වහන්සේට නිරන්තරව උපස්ථාන කෙරෙමින් ආගමික, අර්ථික හා සංස්කෘතික අංශයන්ගෙන් රට සංවර්ධනය කෙළේය.

තවද පොළොන්නරු නුවර සිසාරා පූර්වාරාමය, දක්ෂිණාරාමය, පශ්චිමාරාමය, උත්තරාරාමය, කපිල වස්තුව, ඉසිපතනය, කුසිනාරාරාමය, වේලුවනාරාමය



ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

ජේතවනාරාමාය, ලංකා තිලකය, තිවංකය, ඇතුබඳ ලෙනය යනාදී විසිතුරු විහාර කරවා එහි නොයෙක් දහස් ගණන් මහා සංඝයා වස්වා

**විරුදනාමයෙන් සිදුකළ පිරිවෙන් සේවා**

1. තුන්සිය හැටක් පිරිවෙන් පොළොන්නරු අග්‍රරාජධානියට අනුබද්ධව ඇති කිරීම

2. අෂ්ටමූලායතනයන් පුනර්ජීවයට පත් කිරීම

3. ජේතවනාරාම පිරිවෙන

4. මහින්ද සෙල පිරිවෙන

5. චෝළ කුලාන්තක පිරිවෙන ආදි කීර්තිමත් ආයතන

බොහෝ ටීකා ග්‍රන්ථ ලියන ලද්දේ ජේතවනාරාම-පිරිවෙන් ආයතනයේදීය.

**විශේෂ ශාස්ත්‍රීය සේවා:**

1. පාළි හා සංස්කෘත ව්‍යාකරණ ගුරුකුල දෙකක් බිහිවීම

2. ග්‍රන්ථ කරණයේදී සකු කවීන් ප්‍රියකළ වෛදර්භී රීතිය අනුගමනය කිරීම

3. අභිධර්ම විෂය කෙරේ ගිහි-පැවිදි දෙපක්ෂයේ ම අභිරුචිය දැක්වීම

4. මුල් ම ප්‍රධාන කතිකාවත පැනවීමෙන් භික්ෂු විනය නය කෙරේ වළංගු භාවයක් ඇති කිරීම

5. සංස්කෘත භාෂා මාධ්‍යයට අවනතව මිශ්‍ර සිංහල භාෂාවේ ප්‍රගමනය ඇතිවීම

6. පද්‍ය සාහිත්‍යයේ අගනා කෘති පාළි, සකු හා හෙළ බස්වලින් නිර්මාණයකිරීම

7. ගිහි-පැවිදි දෙපසට ත්‍රිපිටක ධර්මයත් සෙසු භාෂා ශාස්ත්‍ර ප්‍රමුඛ විවිධ අනුබද්ධ විෂයයනුත් පිරිවෙන්වලදී ම ඉගෙනීමට පෙළඹීම

8. රාජ්‍යපාලක රජු ප්‍රධාන ප්‍රජාව අභිධර්ම විෂය කෙරේ දක්වූ අවධානය නිසා අනුරුද්ධාචාර්යයන් විසින් එම විෂය යටතේ පරමත්ථ විනිච්ඡය, නාමරූප පරිච්ඡේදය හා අභිධම්මත්ථ සංගහ යන අභිධර්ම ග්‍රන්ථ ලියා ඉදිරිපත් කිරීම

9. කෙෂ හා ශතක විෂයයන් විෂයමාලාවට අන්තර්ග්‍රහණය වූයේ ද මෙවකය.



ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

සකු බස් වහරින් පරිපෝෂිත ග්‍රන්ථ රාශිය විද්වත් ගෘහස්ථ ප්‍රව්‍රජිත පර්ෂදයන්හි අතිශය සම්භාවනාවට පාත්‍ර විය.

තවද, ............. ශූරපාදය, ධර්මකීර්තිපාදය, ධීරනාගපාදය, රාජමුරාරිය, කවිරාජ ශේඛරය, ගුරුළු දමිය, ආගමචක්‍රවර්තීය, පරාක්‍රම පණ්ඩිතය අග්‍ර පණ්ඩිතය යනාදීවූ ගෘහස්ථ පණ්ඩිත ජනයෝ ධර්මානුගත ලෝක ප්‍රබන්ධ හා විචිත්‍රාර්ථ ප්‍රකාශ වූ සන්න ගැටපද හා නොයෙක් ධර්ම ව්‍යාඛ්‍යාන ඉපදවූ යුගය අතිශයින් ශොභාවට පත්කළ මෙම කවීන්ගේ කෘති හා සේවා ස්වර්ණ යුගයක් බවට පත් කෙළේය.

ධර්මවේදීන්, වෛයාකරණඥයන්, ලේඛකයන්, භාෂාප්‍රේමීන්, රසඥයන්, න්‍යායවාදීන් මෙන්ම මහාතාර්කිකයන් පිරිවෙන්හිත්, මූලායතනයන් හිත් අධිපති මාහිමිවරුන් හා අග්‍රගණ්‍ය ආචාර්ය යතිවරුන් ආශ්‍රයෙන් ඥානොපලබ්ධිය මොනවට අත්පත් කරගත් නිසා විවිධ විෂයයක ඉගැන්වීම් ක්‍රම හා ලෙඛන විධි අතිශය සම්භාවනීයත්වයක් ඉසිලීය.

**ශාසන විලෝපයක්**

කාලිංගමාඝ (ක්‍රි.ව. 1213-1232) අතිශය කෲර ආක්‍රමණිකයා බුදුසසුනත්, ත්‍රිපිටකයත්, මහසඟරුවනත්, ආගමික සිද්ධස්ථානත් වනසා කළ හානිය කිසිකලෙකත් ඉතිහාසය තුළ නොවූ විරූ දය.

I සාගරමතී ශ්‍රී ශාරිපුත්‍ර මාහිමි (පළමුවන)

II වෛයාකරණ මොගගලලාන මාහිමි (දෙවන)

III ශ්‍රී සංඝරක්ෂිත මාහිමි (තෙවන) යන

සංඝ රාජයන් වහන්සේලා නිසා අතිශයින් සරුවී තිබුණු සසුන් කෙත සාකල්‍ය යෙන් ම නිසරු වී ගියේය. බොධිහාරක සෝමරාජ පරපුරේ විජයමල්ල පුත් කාලිංග විජයබාහු (ක්‍රි.ව. 1232-1236) සතුරන් වනසා රාජධානිය දඹදෙණියට ගෙන ගිය පසු රුහුණු ඇතුළු ප්‍රදේශයන්හි ද, දකුණු භාරතයේ ද සැඟවී සිටි මහ සඟන ආපසු රජු කරා පැමිණියහ. ශ්‍රී සංඝරක්ෂිත මාහිමි ද එහි වැඩමවා මහසඟනගේත් රජ හා ඇමතියන්ගේත් අනුග්‍රහය ඇතිව යළි නිසරු වී ගිය සසුන් කෙත සරුකිරීමෙහි ලා සියලු කටයුතු සපුරාලූහ. රජුගේ ජ්‍යෙෂ්ඨ පුත්‍ර දෙවන පැරුකුම්බා ශ්‍රී සංඝරක්ෂිත මාහිමියන්ගේ ශිෂ්‍යවරයා ය. රජු තම පියා මෙන් ම මාහිමිවරුන්ගේ හා වනවැසි, ගම්වැසි යතිවරුන්ගේ මූලිකත්වයෙන් පැනවූ කතිකාවලින් තුන් නිකායික මහ සඟනගේ විනයානනුකූල පැවැත්ම ආරක්ෂා කිරීමට හිතා ගත්තේ ය. ඔබ සිංහල ඉතිහාසයේ පළමුවන පණ්ඩිත පරාක්‍රමබාහු ය. ජා යුද්ධය ජයගෙන, රට ද බතින් සරුකොට, උපසම්පද උත්සව අටක් ම සිදුකොට සෙනසුන් (පළාබත්ගල) ඇතිකොට, තමා ද ත්‍රිපිටකාචාරී බැවින් අග්‍රගණ්‍ය ග්‍රන්ථ ද නිෂ්පාදනය කෙළේය. සිංහල පද්‍ය සාහිත්‍යයේ මුදුන් මිණ වශයෙන් සලකන කව් සිළුමිණ, විසුද්ධිමාර්ග සන්නය, වන විනිස සන්නය ඔබ ලියූ මහාර්ඝ කෘතීහුය. රජුගේ ප්‍රධාන ඇමැති දෙවප්‍රතිරාජ අමාත්‍යවරයා



ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

විසින් පතිරජ පිරිවෙන පිහිටවූ අතර එහි පරිවේණාධිපති අනවමදර්ශී මාහිමියන් විසින් සිංහලයේ වියරණ අත්පොත වන සිදත් සඟරාව ලියන ලදි.

කලිකල් සවැනි පැරකුම්බාගේ පියරජු පරිහානියට පත් පිරිවෙන් හා මූලායතන පුනර්ජීවයට පත්කරමින්, දඹදෙණියේ විජයසුන්දර පහය, වත්තල විජයබාහු පිරිවෙන පිහිටුවමින්, මායාරට ඓතිහාසික කැලණි විහාරය ප්‍රතිසංස්කරණය කරවමින්, ගම්වැසි, වනවැසි හිමිවරුනට තෙර, මහතෙර, ආයතන හා මාහිමි පදවි පිරිනමමින්, කතිකාවත් පනවමින්, කොත්මලේ සඟවා තුබූ දළඳ බෙලිගල් නුවර පව්වේ සැදූ දළඳ මැඳුරක තබා රැකවරණ සලසමින් උදර සේවයක් කෙළේය. රජුට සම්පූර්ණ කළ නොහැකි වූ සුවිසල් කර්තව්‍යයන් රැසක් සම්පූර්ණ කරන ලද්දේ ඝවකීය පුත්‍ර දෙවන පැරකුම්බාවන් විසිනි.

## ධර්මකීර්ති පරපුර

1. රාජගුරු පරීක්ෂක ධූරන්ධර ධර්මකීර්ති මහතෙර පාණෝ (ක්‍රි.ව. 1160-1212) කලයේ වැඩ සිටි දඨාවංස චූලවංස කතෘන් වහන්සේ

2. තමලිංගමුවෙන් වැඩමවාගත් පළාබත්ගල ධර්මකීර්ති මහතෙරපාණන් වහන්සේ

3. වෙඩසවංශික පළාබත්ගල ධර්මකීර්ති තෙර සාමී පසුව මහාසාමි පදවියට පත්වූ හ.

4. ගණවැසිවංශික ශීලවංස ධර්මකීර්ති ප්‍රථම සංඝරාජ වසර 110 ක් ආයුෂ ලදහ. පාරමී ශතක, ජනානුරාග චරිත කතෘ මාහිමි. ගඩලාදෙණි සෙල්ලිපිය.

5. මහදළියාවංශික ශ්‍රී දෙවරක්ෂිත ජයබාහු ද්විතීය සංඝරාජ-බාලාවතර සන්නය, සද්ධර්මාලංකාරය, ජිනබොධාවලී, නිකාය සංග්‍රහය කතෘහුය. ප්‍රථම සංඝරාජයන්ගේ අනුජාත ශිෂ්‍ය පුත්‍ර.

6. ධම්ම දින්නාචාර්ය විමලකීර්ති තෘතීය ධර්මකීර්ති සංඝරාජ. ඔබ විසින් සද්ධර්මරත්නාකරය රචනා කරන ලදි. ද්විතීය ධර්මකීර්ති සංඝරාජයන් අනුජාත ශිෂ්‍ය පුත්‍රයන් වහන්සේ ය. සංඝරාජ යනු තත්කාල ශාසනානුශාසක පදවිය යි.

සිව්වන පැරකුම්බා (ක්‍රි.ව. 1303-1333) පණ්ඩිත බැවින් දෙවැන්නා ය. එහෙයින් දෙවන පණ්ඩිත පරාක්‍රමබාහු නම් වී. රජු විසින් වීදගම ශ්‍රී ඝනානන්ද පිරිවෙන හා කුරුණෑගල ශ්‍රී පරාක්‍රමබාහු පිරිවෙන පිහිටුවී. ද්විභූමක ප්‍රාසාදයක් පිරිවෙන් භූමිය තුළ ඉදිකළ රජු පිරිවෙන්පති ශ්‍රී මෙධඞ්කර හිමියන්ට ජාතකභාරකාරත්වය පවරා ජාතක පොත ලිවීමේ කාර්යභාරය පැවැරිය. රජු ප්‍රථමයෙන් ඝවකීය ආචාර්ය සොළී කායසත්ථි මහතෙරුන්ගෙන් තෙවරක් ම ජාතක පාළිය, ජාතකට්ඨ කථාව උගත්තේය. පන්සිය පණස් ජාතක පොත ලිවීමේ කාර්යය සඳහා රජු විසින් නඩත්තුවට පරණගම, තැඹිලිපොල, දෙල්මඩ හා මොරවක යන ගම්වල සම්පූර්ණ ආදායම ද පිරිනමා තිබේ. රජු විද්දුම ග්‍රාමයේ ශ්‍රී ඝනානන්ද පිරිවෙන කරවා පුද කෙළේ, රාජගුරු



ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

මහතෙරණුවන්ට ය. ගස් පත්දහසක් ඇති පොල් උයන ද, ගිංගහබඩ සල්ගම ද, එහි නඩත්තුව සඳහා පැවරීය. දෙවුන්දර නන්‍දන පිරිවෙන අභාවයට යා නොදී ප්‍රතිසංස්කරණය කොට උපුල්වන් දෙවොලට දී තිබූ ගැටමාන්න නම් ගම එහි නඩත්තුව සඳහා පවරා දුනි. අග්‍රබෝධි පිරිවෙන ප්‍රතිසංස්කරණය කොට නඩත්තුවට ඇල්ගිරි ගම පුදළීය. කිත්සිරිමෙවන් කැලණියේ වූ ගතාර (ග්‍රන්ථකාර) පිරිවෙන ද පිළිසකර කොට අනුග්‍රහ ලබාදුණි.

## සවන පැරකුම්බා

ශ්‍රී සනානන්‍ද පරිවේණාධිපති මහ වීදගම හිමියන් සුනෙත්‍රා මහ දේවියගේ පුත් කුමරා හදවඩා අකුරු කරවා ක්‍රි.ව. 1410 දී vi වන පරාක්‍රමබාහු නමින් ලංකා රාජ්‍යයට පත් කෙරිණ. මේ රට යස ඉසුරින් පිරි සෞභාග්‍ය සම්පන්න යුගයක ආරම්භය සිදුවිය. නොබෝ කලකින් භාෂා විශාරදයකු, සාහිත්‍යධරකු, ග්‍රන්ථකාරයකු, කලාකාමියකු හා ධර්මධරයකු වූ රජු ගිහි-පැවිදි විද්වතුනට ශාස්ත්‍රීය සේවය සඳහා අනේකවිධ අනුග්‍රහයන් දක්වී. භික්ෂු අධ්‍යාපනයේ ස්වර්ණ යුගයක් බවට පත්වූ මේ පැරැකුම්බා නරේශයන්ගේ යුගය රටට සෞභාග්‍යය ගෙන දුන්නේය.

## පිරිවෙන් ආයතන

1. තොටගමුවේ සිරි විජයබා පිරිවෙන
2. පැපිලියානේ සුනෙත්‍රාදෙවී පිරිවෙන
3. කැරගල පද්මාවතී පිරිවෙන
4. පළාබද්ගල වනවාසී පිරිවෙන
5. මහා නෙත්තපාසාද මූලය හා රාජග්‍රාම ශ්‍රී සනානන්‍ද පිරිවෙන
6. ගලතුරුමූලට අයත් දෙවිනුවර ඉරුගල්කුලතිලක පිරිවෙන
7. වනවාසී නිකායික කෝට්ටේ එරබත්තොට ධර්මරාජ පිරිවෙන
8. තියම්ගම්පායේ ජයමහලේ සිටුපාය පිරිවෙන
9. විල්ගම්මුල ආයතනයට අයත් කැලණියේ ගතාර පිරිවෙන
10. පඬුමූල පිරිවෙන
11. කැලණියේ ගතාර පිරිවෙන
12. ලංකාතිලක ලංකා සෙනෙවිරද් පිරිවෙන
13. උස්සාපිටියේ මහපියා පිරිවෙන



ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

මේ යුගයේ සවැනි පැරැකුම්බා හා සිරි රහල් මාහිමි ගැන පමණක් සවිස්තර ගොනු කළ හොත් සුවිසල් සම්භාවනීය ග්‍රන්ථයක් තරමට සශ්‍රීක වනු නිසැකය. දේශීය විදේශීය අභිධාන පූර්ව සම්මානනයට පාත්‍රවූ 'මහාකවි, පණ්ඩිත ශිරෝමණී ෂට්භාෂා පරමේශ්වර රාජගුරු ත්‍රිපිටක වාගීශ්වරාචාර්ය සිරිසඟබෝ ශ්‍රී විජයබාහු පරිවේණාධිපති මහා සාමි' වශයෙන් සුවිශේෂ කීර්තියට පත්වූ ශ්‍රී රාහුල සංඝරාජයන් බුද්ධිපාටවය, සමරණ ශක්තිය, අසිරිමත් ප්‍රතිභානය හා ස්වාධීන චින්තනය එක ම පඤ්චිකා ප්‍රදීපයෙහි පිඩු කොට ඇත. ප්‍රතිපත්තියට හේතුව පර්යාප්තිය බව, ප්‍රතිපත්තිය අධිගමයට හේතුව බවත් මාහිමි තත් කෘතියෙහිදී උගන්වා ඇත. සංක්ෂෙපයෙන් සිරිරහල් මාහිමි කවර නම් ශ්‍රේෂ්ඨ සඟරජ හිමිනමකදැයි පදසාධන ටීකාවේ නිගමන පද්‍යයෙන් මොනවට නිගමනය වේ.

'සාරිපුත්ත, මහාදිසාමී ජින නෙ ජාතස්ස සමභාවිතෙ
නත්තා උත්තරමූළ රාහුල මහා ථෙරස්ස සික්ඛාගරු
ව්‍යාඛ්‍යාතො පද-වාක්‍ය-තක්ක කුසලො වාදීභසීහො සුධී
සො වාචිස්සර සංඝරාජ පවරො ව්‍යාකාසි ටීකං ඉමං'

මාහිමියන් හැරුණුවිට කෝට්ටේ රාජධානි යුගය ශොභාමත් කළ ශ්‍රේෂ්ඨ මාහිමිවරුන් ගණනාවක් වූහ.

1. ජයවර්ධන පුර වනරතන මාහිමි 2. ධම්මදින්නාචාර්ය විමලකිත්ත ධර්මකීර්ති මාහිමි 3. පැපිළියාන විහාර අධිපති ගලතුරුමූල මෛධංකර මාහිමි 4. වීදගම මහානෙත්තපාසාදමූල ශ්‍රී සනානන්ද පරිවේණාධිපති මෛත්‍රීය මාහිමි 5. සුනෙත්‍රා මහාදෙවි පරිවේණාධිපති මංගල මාහිමි 6. කැරගල පද්මාවතී පරිවේණාධිපති රාජගුරු ශ්‍රී වනරතන මාහිමි 7. එරබත්තොට ධර්මරාජ පරිවේණාධිපති නියදවනේ වූසාදෙව සුමංගල තෙරපාණෝ 8. ඉරුගල්කුල තිලක පරිවේණාධිපති මහ තෙරපාණෝ ගලතුරුමූලට අයත්හ. 9. කැලණියේ ගතාර පරිවේණාධිපති බුවනෙකබා මහ තෙරපාණෝ 10. තොටගමුවේ සිරිවිජයබා නිවැසී-සිරිරහල් මාහිමි අතවැසි වැත්තෑවේ තෙරිඳු.

මේ යුගය වනවිට අෂ්ටායතනයන්ගෙන් ඉතිරිව පැවැත්තේ

1. ගලතුරුමූල 2. උත්තරමූල 3. විල්ගම්මූල 4. මහනෙත්පාමූල යන සතර පමණි. තව ද ගම්වැසි, වනවැසි දෙකුලයට ම අයත් පිරිවෙන් වෙන් වෙන් වශයෙන් මෙසේ ය.

**ගම්වැසි** : 1. තොටගමුවේ සිරි විජයබා 2. කැලණියේ ගතාර 3. සුනෙත්‍රා මහාදේවී 4. සප්තරතන පතිරාජ 5. ලංකා සෙනෙවිරත්

**වනවැසි** : 1 කැරගල පද්මාවතී 2. එරබත්තොට ධර්මරාජ 3. පඤ්චමූල 4. ශ්‍රී නිවාස 5. වීදගම ශ්‍රී සනානන්ද

කෝට්ටේ රාජ්‍ය යුගය තුළ වනවැසි ගම්වැසි දෙනිකායේ අධ්‍යාපන ප්‍රතිපත්තීන්හි ඉමහත් තරඟකාරී ස්වරූපයක් පැවැත්තේය.



ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

ක්‍රි.ව. 1505 සිට ක්‍රි.ව. 1796 දක්වා වූ කාල පරිච්ඡේදය පෘතුගීසී හා ලන්දේසි ආක්‍රමණ හා ලංකාවේ මුහුදුබඩ පෙදෙස් ඔවුන්ගේ අණසකට යටත්ව පැවති යුගය සේ සැලකෙන අතර කෝට්ටේ රාජ්‍ය යුගයේ වූ සෞභාග්‍යය සම්පූර්ණයෙන් නෂ්ටප්‍රාය විණි. මේ අතර පළමුවන රාජසිංහ රජුගේ (ක්‍රි.ව. 1580-1592) ශාසනවිලෝපය නිසා සසුනත්, මහසඟරුවනත්, දහමත්, අගනා පොත්පත් සම්භාරයත් සම්පූර්ණයෙන් විනාශ මුඛයට පත්විය. ඉතිරි වූ ඇතැම් මහා සංඝයාත්, බෞද්ධ ප්‍රභූහුත් උඩරට රාජ්‍යයේ රැකවරණ පතා එහි ගියහ. උපසම්පන්න භික්ෂූන් නැතිව ගියෙන් ඉතිරිවූයේ තෙරුන්නාන්සේලා හා ගණින්නාන්සේලාය. සසුන් පිළිවෙත් ගැන කිසිත් පුහුණුවක් හෝ දැනුමක් නොවීය. මේ අතරය තුම්පනේ කුලතුංග මුදලිගේ පුත් කුලංතුග කුමරු 1698 දී උපත ලබා රජමැඳුරේ පුත් තනතුරේ හැදීවැඩී වීරපරාක්‍රම නරේන්ද්‍ර සිංහ රජ (ක්‍රි.ව. 1707-1759) දවස සොළොස්වියේදී සූරියගොඩ නරේන්ද්‍රාරාම විහාරයේදී විහාරේ ගෙදර කිත්සිරි මෙවන් රාජසු සාමණේර නමගෙන් ප්‍රව්‍රජ්‍යාව ලබා වැලිවිට සරණඞකර සාමණේර නමින් ප්‍රකටව සසුන් කෙත සරු කිරීම සඳහා පියවර ගත්තේය. සෝත්සාහයෙන් තෙවළා දහම, පාළි, සකු භාෂාශාස්ත්‍රත් උගෙනිමින් 'සිල්වත් සමාගම' ඇති කොට රට පුරා තත් සමාගමේ ජාතික, ආගමික කටයුතු ව්‍යාප්ත කළහ. නරේන්ද්‍රසිංහ, ශ්‍රී විජයරාජ සිංහ යුගවලදී උපසම්පදව මෙහි ගෙනජ් මට ප්‍රයත්න දැරුවද, කිහිපවරක් ම අසාර්ථක විය. එහෙත් අනතුරුව රාජ්‍යපදප්‍රාප්ත කීර්ති ශ්‍රී රාජසිංහ දවස රජුගේ පූර්ණ අනුග්‍රහයෙන් සියමෙන් උපාලි හිමියන්ගේ ප්‍රධානත්වයෙන් උපසම්පදව මෙහි ගෙන ආහ. මුල් ම උපසම්පදව ක්‍රි.ව. 1753 දී මහනුවර පෝයමළු විහාරයේ සීමාමාලකයේදී සිදු කළහ. අනතුරුව සිය දහස් ගණනින් උපසම්පත්තිය ලැබූ තෙරවරුන් නිසා යළි සසුනත්, ශබ්දශාස්ත්‍රත් අභිවර්ධනයට පත්වී. අතීත මූලායතන හා පිරිවෙන් අභාවයට ගොස් තිබිණි. සරණඞකර හිමිට රජු විසින් සුවිශේෂ වටාපත පිළිගත්වා සංඝරාජ පදවිය පිරිනමන ලදි. පෝයමළු විහාරයේ තිබ්බටුවාවේ ශ්‍රී බුද්ධරක්ඛිත හිමියන්ට හා අස්ගිරි විහාරයේ උරුලැවත්තේ ධම්මසිද්ධි හිමියන්ට විහාර දෙපාර්ශ්වයේ මහානායක පදවි ද රජු විසින් පිරිනමන ලදි.

## නියමකන්ද ශාස්ත්‍රායතනය

රජුගේ අනුග්‍රහය ඇතිව නියමකන්ද ශාස්ත්‍ර ශාලාවක් බවට පත්කළ සඟරජ හිමියෝ උඩපාත දෙරට ම මහාසංඝයා ව්‍යාප්තව ගොස් ස්වකීය ප්‍රදේශයන්හි ආගම දහම මෙන්ම ශබ්දශාස්ත්‍ර ද දියුණු කිරීමෙන් පුනර්ජීවයක් ඇතිකළහ. 1830 දී පැල්මඩුල්ලේ ශාස්ත්‍රශාලාවත්, එහි උගත් වලානේ ශ්‍රී සිද්ධාර්ථ හිමි රත්මලානේ පරම ධම්මචෙතිය පිරිවෙනත්, එහි උගත් හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමි ක්‍රි.ව. 1873 දී මාළිගාකන්දේ විද්‍යෝදය පරිවෙනත්, රත්මලානේ ශ්‍රී ධර්මාලොක හිමි පැලියගොඩ විද්‍යාලංකාර පිරිවෙනත් ආරම්භ කළහ. ඒවායේ උගත් තෙරවරු රටේ අධ්‍යාපන අවශ්‍යතා සපුරාලමින් දිවයින පුරා පිරිවෙන් ආරම්භ කළහ. 1902 වර්ෂයේ ගිහි-පැවිදි විසිතුන් දෙනකුගේ ප්‍රධානත්වයෙන් පිහිට වූ කොළඹ ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ කාර්යභාරය නිසා රටට අවශ්‍ය පැවිදි ගිහි පඬිවරුන් රැසක් බිහිවීම මෙම අධ්‍යාපන ක්‍රමයේ සුවිශේෂ ප්‍රතිඵලයයි.



ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

1. ක්‍රි.ව. 1905 දී ප්‍රාචීන විභාගය ආරම්භ කිරීම

2. 1920 දී විෂය නිර්දේශ විධිමත්ව පිළියෙල කිරීම

3. 1947 පළමුවන පිරිවෙන් ව්‍යවස්ථාමාලාව රජය විසින් නිකුත් කිරීම

4. 1958 විද්‍යොදය, විද්‍යාලංකාර දෙපිරිවන විශ්වවිද්‍යාලය තත්වයට උසස් කිරීම

5. 1959 දෙවන පිරිවෙන් ව්‍යාවස්ථා මාලාව රාජ්‍ය සභාවෙන් සම්මත කිරීම

6. 1979 අංක 64 දරණ පිරිවෙන් නියෝගමාලාව පාර්ලිමේන්තුවෙන් සම්මත කිරීම හා

7. 1980 අංක I දරණ පිරිවෙන් නියෝග මාලාව පාර්ලිමේන්තුවෙන් සම්මත කිරීම

මේ අනුව රටපුරා පිහිටුවා ලියාපදිංචි ආධාරලබන පිරිවෙන් සංඛ්‍යාව 570කි. රුපියල් කෝටි තිස්පහකට ආසන්න මුදලක් පිරිවෙන් අධාර යටතේ ගුරුවරුන් 4500 ක් හා පණස්දහකට ආසන්න පැවිදි-ගිහි ශිෂ්‍ය සංඛ්‍යාවක් නඩත්තු කිරීමටත් රජය දැනට වැය කෙරේ.



ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk